රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක: **06/92**

රාජ්‍ය පරිපාලන, පළාත් සභා හා
ස්වදේශ කටයුතු අමාත්‍යාංශය,
නිදහස් චතුරශ්‍රය,
කොළඹ 07.

**1992** ජනවාරි මස **31** වෙනි දින.

**සියළුම:** අමාත්‍යාංශ ලේකම්වරුන්,
පළාත් සභා ප්‍රධාන ලේකම්රුන්,
පළාත් ආණ්ඩුකාර ලේකම්වරුන්,
දෙපාර්තමේන්තු ප්‍රධානීන් හා
දිසාපතිවරුන් වෙත.

**<u>නිවසක් ඉදිකිරීම / වැඩ අවසන් කිරීම සඳහා ණය</u>**
**<u>xxIv පරිච්ඡේදය – ආයතන සංග්‍රහය.</u>**

රාජ්‍ය නිලධාරීන්ට වැටුප් ණය ලබාදීමේ පහසුකම නිවසක් ඉදි කිරීමට හෝ ඉදි කරගෙන යනු ලබන නිවසක වැඩ නිම කිරීම සඳහා දීර්ඝ කිරීමට රජය තීරණය කර ඇත.

**02.** මෙය සම්පූර්ණයෙන්ම අලුත් වැඩ පිළිවෙලක් නිසා ආයතන සංග්‍රහයට කර ඇති පහත සඳහන් එකතු කිරීම් හා සංශෝධන සුපරීක්ෂාකාරීව අනුගමනය කිරීම මැනවි.

**03.** වගන්තිය **2** යටතේ සඳහන් " නිවසක් තැනීම සඳහා ඉඩමක් ................................. (II) වගන්තිය ) " යන වචන පේළිය යටින් පහත සඳහන් වචන පේළිය එකතු කරන්න.

" නිවසක් ඉදිකිරීම / වැඩ නිම කිරීම සඳහා
( II : 16 උප වගන්තිය ) "

**04.** උප වගන්තිය **3:17:8** යටතේ " නිවසක් තැනීම සඳහා ඉඩමක් හෝ නිවාස දේපලක් හෝ අත්කර ගැනීමට ලබාගන්නා ණය " යන වචනවලට පසුව ඒ සමඟම පහත සඳහන් වචන එකතු කරන්න.

" සහ නිවසක් ඉදිකිරීම / වැඩ නිම කිරීම සඳහා
ලබාගන්නා ණය "

**05.** වගන්තිය **5** යටතේ " **(1)** නිවසක් තැනීම සඳහා ඉඩමක් ....................................... ( II වන උප වගන්තිය ) " යන වචනවලට පසුව ඒ සමඟ පහත සඳහන් වචන එකතු කරන්න.

" සහ නිවසක් ඉදිකිරීම / වැඩ නිම කිරීම සඳහා
ණය ( II : 16 උප වගන්තිය ) "

06/92

06. උප වගන්තිය 11:15:1 ට පසුව ඒ සමගම පහත සඳහන් අලුත් උප වගන්ති එකතු කරන්න.

**" 11:16 – නිවසක් ඉදිකිරීම / වැඩ නිම කිරීම සඳහා ණය :**

**සුදුසුකම් :**

විශ්‍රාම වැටුප් සහිත අවුරුදු පහකට (05) නොඅඩු සේවයක් ඇති තනතුරෙහි ස්ථිර කර ඇති, තමන්ට හෝ තම කලත්‍රයාට හෝ තමා -ගෙන් යැපෙන දරුවන්ට නිවසක අයිතියක් නැත්තාවූ ද, තමාගේ හෝ තම කලත්‍රයාගේ හෝ තමාගෙන් යැපෙන දරුවන්ගේ හෝ නමින් කුලියට සින්නවීමේ ක්‍රමය යටතේ ජාතික නිවාස කොමසාරිස්ගෙන් නිවසක් ලබාගෙන නැති ස්ථිර හෝ විශ්‍රාම වැටුප් හිමි නිලධාරියෙක් පහත සඳහන් උප වගන්තිවලට යටත්ව මේ ණය ලබා ගැනීමට සුදුස්සෙක් වේ.

**11:16:2**

වැඩ නිම කිරීමට බලාපොරොත්තු වන නිවස පිහිටි හෝ නිවස ඉදිකිරීමට බලාපොරොත්තු වන ඉඩම උප වගන්තිය 11:1:1 ට අනුකූල විය යුතුය.

**11:16:3**

පහත සඳහන් අවස්ථාවල දී මෙම ණය මුදල ලබාදෙනු නොලැබේ.

(අ) ණය ඉල්ලුම්කරුට හෝ ඔහුගේ කලත්‍රයාට හෝ ඔහුගෙන් යැපෙන දරුවන්ට හෝ අයිති දේපලක් පිළිබඳ වූ උගසක් හෝ එබඳු දේපලක් ඇප වශයෙන් තබා ලබා ගත් ණයක් හෝ බේරුම් කිරීමට;

(ආ) ණය ඉල්ලුම්කරු හෝ ඔහුගේ කලත්‍රයා හෝ ඔහුගෙන් යැපෙන දරුවන් හෝ ඒ වනවිටත් අත්පත් කරගෙන ඇති නිවසක් සම්බන්ධයෙන් ;

(ඇ) වගන්තිය 11 යටතේ ලබාගෙන සම්පූර්ණ වශයෙන් ණය ගෙවා නිමකර නැති නිලධාරියෙක්.

**11:16:4**

අඹුසැමි දෙදෙනාම රජයේ සේවකයන් වෙත්නම් මේ කාර්ය සඳහා ණය දෙන්නේ දෙදෙනාගෙන් එක් අයෙකුට පමණි. එමෙන්ම එක් වරක් පමණි.

**11:17**

**ණය ප්‍රමාණය :**

වර්ෂ පහක (05) වැටුප හෝ උප වගන්තිය 11:20 යටතේ සඳහන් බලය ලත් නිලධාරියකු විසින් සකස් කරන ලද ඇස්තමේන්තුවේ සඳහන් මුදල යන දෙකින් අඩු ප්‍රමාණයට මෙම ණය මුදල සීමා කෙරේ.

**11:18**

**අවශ්‍ය ලියකියවිලි :**

වැඩ නිම කිරීමට බලාපොරොත්තු නිවසක් පිහිටි හෝ නිවස ඉදිකිරීමට බලාපොරොත්තු වන ඉඩම සම්බන්ධව මෙම පරිච්ජේදයේ 4:2:3, 11:3, 11:4, 11:4:1, 11:4:2, 11:5, 11:6, 11:7 සහ 11:7:1 උප වගන්ති යටතේ සඳහන් වාර්තා ඉල්ලුම් පත්‍රය සමග ඉදිරිපත් කළ යුතුය.

**11:19 වෙනත් අවශ්‍යතා :**
**11:19:1 – ඇටෝර්නි බලය :**

ණය දීමට කලින් ඇටෝර්නි බලය පැවරීම 265 වැනි පොදු ආකෘති පත්‍රයේ පිටපත් 03 කින් යුක්තව ලියා අත්සන් කළයුතුය. ඔප්පුවක් තමාට ඉදිරිපත් කළ වහාම දෙපාර්තමේන්තු ප්‍රධානියා ඇටෝර්නි බලය පැවරීමේ ලියවිල්ලේ පිටපත් දෙකක් (02) ලියාපදිංචි කර ආපසු එවීම සඳහා ඉඩම පිහිටි දිස්ත්‍රික්කයේ ඉඩම් රෙජිස්ට්‍රාර් වෙත යැවිය යුතුය. ලියාපදිංචි කිරීම සඳහා යන එක් පිටපතක් 1982 අංක 43 දරණ මුද්දර ගාස්තු පනත හා ඒ යටතේ පනවන රෙගුලාසිවලට නියම කර ඇති, වටිනාකමට සමාන කර ඇති මුද්දරයක් යෙදිය යුතුය. ඇටෝර්නි බලය පැවරීමේ ලියවිල්ලේ (අනු පිටපත් නමින් හැඳින්වෙන ) තුන්වැනි පිටපත එම ලියවිල්ල ලියා අත්සන් කරන ලද මාසය අවසන් වනතුරු දෙපාර්තමේන්තු ප්‍රධානියා ලඟ තබා ගත යුතුය. ඉක්බිතිව ඒ ඒ මාසය තුළ දී ලියා අත්සන් කරන ලද එවැනි නීත්‍යානුකූල ලේඛණවල “ අනු පිටපත් “ 28 වැනි පරිශිෂ්ඨයේ දක්වා ඇති ආකෘති පත්‍රයේ ප්‍රකාරයට පිටපත් දෙකකින් යුක්තව සකස් කරන ලද ලැයිස්තුවක් ද ; ඊළඟ මාසයේ 15 වැනි දිනට හෝ ඊට පෙර ලැබෙන සේ අදාල ඉඩම් රෙජිස්ට්‍රාර් වෙත ඉදිරිපත් කළ යුතුය.

**11:19:2**

ලියාපදිංචි කිරීම සඳහා වන ඇටෝර්නි බලය පවරමින් ලියවිලි ඉහතින් වූ පරිදි ලියාපදිංචි කර, අප්‍රමාදව තමා වෙත ආපසු ගෙන්වා ගැනීමට දෙපාර්තමේන්තු ප්‍රධානියා වග බලා ගත යුතුය. සාමාන්‍යයෙන් ණය මුදල් ගෙවා සති හයක් (06) ඇතුළත මේ ක්‍රියාවලිය අවසන් කළ යුතුය. ඇටෝර්නි බලය පවරමින් ලියවිල්ල ලියාපදිංචි කර ආපසු එවූ පසු, ඉදි කිරීමක් හෝ වැඩ නිම කිරීමක් සම්බන්ධයෙන් වන නිවස පිහිටි ඉඩමේ ඔප්පුව සහ අනෙකුත් ලියකියවිලි සමඟ තිබිය යුතුය.

**11:19:3**

වැඩ අවසන් කිරීමට බලාපොරොත්තු වන නිවස පිහිටි හෝ නිවස ඉදි කිරීමට බලාපොරොත්තු වන ඉඩම් සම්බන්ධයෙන් උප වගන්ති 11:10, 11:11, 11:12, 11:12:1 යටතේ සඳහන් ප්‍රතිපාදන අනුව අවශ්‍ය කටයුතු කළ යුතුය.

**11:19:4** – ඇපකරුවන් - මෙම පරිච්ඡේදයේ 11:8 උප වගන්තිය අනුව විය යුතුය.

**11:20**

උප වගන්ති 11:18 සහ 11:19 යටතේ සඳහන් ලියකියවිලි ද, වරලත් ගෘහ නිර්මාණ ශිල්පියකුගෙන් ලබාගත් සැලසුම් සහ ඇස්තමේන්තුවක් ද සමඟ පොදු 262 (අ) වශයෙන් හඳුන්වා ඇති ආකෘති පත්‍රයේ ඉල්ලීම ඉදිරිපත් කළ යුතුය.

**11:21**

ගොඩනැගිල්ලක වැඩ අවසන් කිරීමක් සම්බන්ධයෙන් වූ විටෙක, දැනට ගොඩනගා ඇති කොටසට වෙනත් ණය දෙන ආයතනයකින් ණය ලබාගෙන ඇති කල්හි, එම ණය එය ලබාගත් කාරණා සඳහා ම වැය කරන ලද බව සනාථ කිරීමට සහතිකයක් සහ ඇටෝර්නි බලය එම ආයතනයට පවරාගෙන තිබේ ද යන බවට සහතිකයක් ද ඉදිරිපත් කළයුතුය. එවැනි අවස්ථාවල දී ගොඩනැගිල්ලක වැඩ නිම කිරීම සඳහා වන දෙවනි ඇටෝර්නි බලය පැවරීමක් කළ යුතුය. ණය මුදල සම්පූර්ණයෙන් අයකර අවසන් වූ වහාම ඇටෝර්නි බලය අවලංගු කර, එම අවලංගු කිරීම ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ ලියාපදිංචි කළ බවට ණය දෙනු ලබන බලධරයාට දන්වන ලෙස, එවැනි ණය මුදලක් ලබාගෙන තිබූ නිලධාරියෙකු විසින් එකී ණය දුන් ආයතනයට ණය දෙන බලධරයා මාර්ගයෙන් දැන්වීමක් කළ යුතුය.

**11:22**

**ණය මුදල මුදාහැරීම:**

නිවසක් ඉදි කිරීම හෝ වැඩ අවසන් කිරීම සඳහා ණය මුදල පහත සඳහන් අවස්ථාවන්හිදී මුදාහැරිය යුතුය.

I. ගොඩනැගිලි භූමිය පළමු

වතාවට පරීක්ෂා කිරීමෙන් පසුව - 50%

II. 50% වැඩ අවසන් කිරීමෙන්

පසු දෙවන පරීක්ෂණයට පසුව - 45%

III. ඇස්තමේන්තුව අනුව සම්පූර්ණයෙන්

වැඩ නිමකළ පසුව - 05%

පරීක්ෂණ කරනු ලබන්නේ මධ්‍යම මට්ටමේ කාර්මික සේවයේ දෙවන ශ්‍රේණියට නොඅඩු තත්ත්වයේ කාර්මික නිලධාරියෙකු විසින් වන අතර, එවැනි නිලධාරියකු විසින් නිකුත් කරනු ලබන සහතිකයක් එම ප්‍රදේශයේ ප්‍රාදේශීය ලේකම්/ අතිරේක දිසාපති විසින් අනු අත්සන් කළ යුතුය.

**11:23**

නිලධාරියා විසින් ලබාගන්නා ලද කොටස් මුදල් සම්බන්ධයෙන් පමණක් 7.2% වන ප්‍රමාණයට පොලී අය කළ යුතුය.

මෙම ණය සම්බන්ධයෙන් කෙරෙන අය කිරීම් සඳහා මෙම පරිච්ඡේදයේ 3 වන වගන්තිය යටතේ සඳහන් අවකරන සීමාවන්ගෙන් නිදහස් කරනු ලැබේ.

**11:24**

ණය ලබාගැනීම සඳහා ඉදිරිපත් කරන ලද ඇස්තමේන්තුවේ සඳහන් සියළුම වැඩ කොටස් පළමුවැනි කොටස් මුදල් ලබාගත් දිනයේ සිට මාස 12 ක් ඇතුළත නිම කළ යුතුය. "

07. මේ සම්බන්ධයෙන් භාවිතා කළ යුතු ආකෘති පත්‍ර පහත සඳහන් පරිදි වේ.

i. පොදු 262 (අ) ආකෘති පත්‍රය මෙම චක්‍රලේඛයට අමුණා ඇත. මෙය ණය ඉල්ලුම් කරන ආකෘති පත්‍රය වේ.

ii. පොදු 263 ගිවිසුම - ඒ ආකාරයෙන් ම

iii. පොදු 264 ඇප බැඳුම්කරය – ඒ ආකාරයෙන් ම

iv. පොදු 265 අවලංගු නොකළ හැකි ඇටෝර්නි බලය සංශෝධන කළ ආකෘති පත්‍රය මෙයට අමුණා ඇත.

පොදු 262 (ආ) සහ පොදු 265 ආකෘති පත්‍රවල දෙමළ පරිවර්තනයන් යථා කාලයේ දී එවනු ඇත.

08. ප්‍රාදේශීය ලේකම්/ අතිරේක දිසාපති විසින් අනුමත කරනු ලබන ගමන් ගාස්තුවලට අමතරව එක් ගොඩනැගිල්ලක එක් පරීක්ෂණයක් සඳහා දෙපාර්තමේන්තු නිලධාරියෙකුට ගෙවනු ලබන ගාස්තුව රු. 150/= ක් වේ. එවැනි පරීක්ෂණ කිරීමේ දී එක් ගමනකින් පමණක් එක් පරීක්ෂණයක් කිරීම සඳහා අවශ්‍ය විධිවිධාන සකස් කර ගත හැකිය.

අ.කලේ/ (ආර්.අබේරත්න)
ලේකම්,
රාජ්‍ය පරිපාලන, පළාත් සභා හා
ස්වදේශ කටයුතු අමාත්‍යාංශය.

06/92

පොදු – 262 (අ)

**නිවාසයක් තැනීම/ නිවසක වැඩ නිම කිරීම සඳහා**
**ණය ඉල්ලුම් පත්‍රය**

(අමාත්‍යාංශයේ ලේකම් වෙත දෙපිටපතකින් යුතුව එවිය යුතුය.)

01. නිලධාරියාගේ සම්පූර්ණ නම :-
02. තනතුර, දැනට සිටින පංතිය හෝ ශ්‍රේණිය:-
03. මුලින් ම පත් වූ දිනය :-
04. උපන් දිනය හා දැනට වයස :-
05. විශ්‍රාම වැටුප් සහිත ස්ථිර පත්වීමක් ද? එසේ නම්, කවර දින සිට ද?
06. දැනට ලබන ඒකාබද්ධ වාර්ෂික වැටුප (දීමනා හැර) :-
07. නිවස ඉදිකිරීමට අදහස් කරන, ඉඩම පිළිබඳ සම්පූර්ණ විස්තරය :-

(ඉඩමේ ප්‍රමාණය, සැලැස්මෙහි අංකය. පිහිටීම සහ ලියාපදිංචි කොට තිබෙන කොට්ඨාශය සඳහන් කළ යුතුය.)

08. ඇස්තමේන්තු කළ මුදල :-
(සහතික කළ ඇස්තමේන්තුවේ පිටපතක් ඇමිණිය යුතුය.)

09. ශ්‍රී ලංකා ජනරජයෙන් ලබාගත් ණය සහ අත්තිකාරම් මුදල්වලින් හා ලොහෝර් ආර්යා අරමුදලෙන් ලබාගත් ණය මුදල්වලින් ගෙවිය යුතුව ඇති ශේෂයන් :-

(අ) මු.රෙ. 1132 යටතේ :-
(ආ) ලෝහෝර් ආර්යා අරමුදලෙන් :-
(ඇ) 1975 අංක. 23 දරණ ණය සහන සභා පනත යටතේ :-

10. දැන් ඉල්ලුම් කරන ණය මුදල :-

11. අයදුම්කරුගේ හෝ ඔහුගේ භාර්යාවගේ හෝ ඔහුගෙන් යැපෙන දරුවන්ගේ හෝ නමින් සම්පූර්ණයෙන් හෝ කොටස් වශයෙන් හෝ යම්කිසි නිවසක් ඇත්නම්,එහි විස්තරය :-

12. මීට අදාල වෙනත් කරුණු:-

13. මා විසින් කරන ලද ඉහත සඳහන් ප්‍රකාශයන් සත්‍ය බව ද,

මා සතුව හෝ මගේ කලත්‍රයා සතුව හෝ මගෙන් යැපෙන කිසිම දරුවකු සතුව හෝ නිවාසයක් නැති බව හා අප කිසිම කෙනෙකු කුලියට සින්නවීමේ ක්‍රමය යටතේ ජාතික නිවාස කොමසාරිස්ගෙන් නිවාසයක් ලබාගෙන නැති බව ද,

එසේම

මා හෝ මගේ කලත්‍රයා හෝ මේ කාර්යය සඳහා මීට කලින් ණය මුදලක් ලබාගෙන නැති බව ද,

වෙනත් කිසිදු රජයේ නිලධාරියකු විසින් ලබාගන්නා ලද ණය මුදලක් සඳහා ඇපකරුවකු වශයෙන් මා අත්සන් කර නැති බව / පහත දක්වෙන රජයේ නිලධාරීන් විසින් ලබාගන්නා ලද ණය මුදල් සඳහා ඇපකරුවකු වශයෙන් මා අත්සන් කර ඇති බව ද,

| **නිලධාරියාගේ නම.** | **දෙපාර්තමේන්තුව.** | **ණය මුදලින් ගෙවීමට ඉතිරිව ඇති ශේෂය.** |
|---|---|---|
| ........................................ | ...................................... | .................................. |
| ........................................ | ...................................... | .................................. |
| ........................................ | ...................................... | .................................. |

මට ණය මුදල ගෙවනු ලැබීමෙන් පසු දින 30 ක් ඇතුළත ගොඩනැගිල්ල ඉදිකිරීමේ කටයුතු ආරම්භ කිරීමට පොරොන්දු වන බවට ද, ගොඩනැගිල්ල ඉදිකිරීම සඳහා දෙනු ලබන ණය මුදලට අමතරව අවශ්‍ය වන මුදල් සපයා ගැනීමට මට පුළුවන් බවට ද, මෙයින් ප්‍රකාශ කරමි.

...................................

ඉල්ලුම්කරු.

ස්ථානය :-

දිනය :-

අංකය:-......................

.......................................වෙතටයි,

නිවාසයක් තැනීමට / නිවසක වැඩ නිම කිරීමට ණය මුදලක් ලබා ගැනීම සඳහා ...........................................මහතා/ මහත්මිය/ මෙනවිය විසින් 262 (අ) වැනි පොදු ආකෘති පත්‍රයේ ලියා ඉදිරිපත් කොට ඇති ඉල්ලුම් පත්‍රයක් පිටපත් දෙකකින් යුක්තව මේ සමඟ එවමි.

1. xxIv වැනි පරිච්ඡේදයේ සඳහන් ව්‍යවස්ථාවල නියමයන් අනුව මේ ණය මුදල ලබා ගැනීමට ඉල්ලුම්කරුට සුදුසුකම් ඇත්තේය.
2. ඉල්ලුම් පත්‍රයේ 1 වැනි කොටුවේ සිට 13 වැනි කොටුව දක්වා කොටුවල ඇති කරුණු මා විසින් හරි වැරදි බලන ලද අතර, ඒවා නිවැරදි බව පෙනේ.
3. නිලධාරියා සතුව හෝ සිය කලත්‍රයා සතුව හෝ යැපෙන දරුවන් සතුව හෝ නිවාසයක් නැත. කුලියට සින්නවීමේ ක්‍රමය යටතේ ජාතික නිවාස කොමසාරිස්ගෙන් නිවාසයක් ලබා ගෙන ද නැත.

4. පහත සඳහන් ලියකියවිලි ද මේ සමඟ ඉදිරිපත් කරනු ලැබේ.

(I) පොදු 263 වැනි ආකෘති පත්‍රයේ ලියා අත්සන් කරන ලද ගිවිසුම ඉඩමේ විස්තරයක් එහි පසු පිටේ සඳහන් කර ඇත.
(II) පළාත් පාලන ආයතනයේ සහතිකය
(III) ............................................ ගෙන් ලබාගත් ඇස්තමේන්තුව
(IV) පිඹුරු කඩදසිය
(V) නිලධාරියාගේ ප්‍රකාශය

දිනය :-

........................................
දෙපාර්තමේන්තු ප්‍රධානියා.

## අවලංගු නොකළ හැකි ඇටෝර්නි බලය.

........................................................................................................................පදිංචි ........................................................................වන මා සියල්ලන් වෙතම දන්වා සිටින වග නම්,

මීට යාකොට ඇති උපලේඛණයේ සඳහන් ඉඩමේ නිවසක් ඉදිකිරීම සඳහා මවිසින් රුපියල්..........................................................ක මුදලක් ණයට ගන්නා ලදුව ඇති බැවින් ද, මවිසින් එසේ ණයට ලබාගන්නා ලද මුළු මුදල සියයට ...............ක පොලියක් සහිතව, ( මෙහි මින්පසු එකී “ ජනරජය “ යයි හඳුන්වනු ලබන ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ සේවයෙහි නියුක්ත නිලධාරියකු වශයෙන් මට ලැබෙන වැටුපෙන් හෝ පඩිනඩිවලින් කොට වශයෙන් අඩුකර ගැනීමෙන් ආපසු ගෙවිය යුතු බවට යෝජනා කොට ඇති බැවින් ද,

එකී ණය මුදල හෝ ඉන් කොටසක් හෝ ගෙවීමට ඉතිරිව තිබිය දී මොනයම් හේතුවක් නිසා වුව ද, එකී ජනරජය යටතේ වූ මගේ සේවය අවසන් වුවහොත්, එකී දේපොළ විකුණා ණය මුදලෙන් ආපසු ගෙවීමට එවකට ඉතිරිව ඇති මුදල එකී ජනරජයට ගෙවා ඉතිරි මුදල මට හෝ මගේ උරුමක්කාරයන්ට හෝ පොල්මංකාරයන්ට හෝ අද්මිනිස්ත්‍රාසිකරුවන්ට හෝ ගෙවීමට හැකි වන පරිදි අදාල අමාත්‍යාංශයේ ලේකම් වෙත බලය පැවරෙන හෝ ඔහු නමින් වූ අවලංගු නොකළ හැකි ඇටෝර්නි බලපත්‍රයකට මවිසින් අත්සන් කළ යුතු බවට මගෙන් ඉල්ලීමක් කරන ලදුව, ඊට මා එකඟ ව සිටින බැවින් ද, එකී ඉල්ලීම ප්‍රකාර ........................................................................................ ..........................................................පදිංචි එකී.................................................................................... ..........................................................වන මා එකී රුපියල්.......................................... මුදලක් ණයට ගැනීමට කරුණු කොට, මීට යා කොට ඇති උපලේඛණයේ විශේෂයෙන් විස්තරව සඳහන් කොට ඇති දේපොළ ඇටෝර්නි බලකරුට නිසි යයි හෝ අවශ්‍ය යයි පෙනී යන යම් මිලකට නොහොත් යම් අන්දමකට විකිණීමට, පැවරීමට හෝ හිමි කිරීමට අදාල අමාත්‍යාංශයේ ලේකම් වන එමෙන් ම යාවකාලීනව එම පදවිය උසුලන.......................................................................... ..................................................................පදිංචි .......................................................... ..........................................................යන අය මගේ ඇටෝර්නි බලකරු වශයෙන් මවිසින් අවලංගු නොකළ හැකි පරිදි මෙයින් නම්කර සිටින බවත්, පත්කර සිටින බවත් මෙම ලේඛණය සාක්ෂ්‍ය කොට ගෙන සියල්ලක් විසින් දත යුතුය.

එකී මුදල ලැබුණු කල්හි, ඉඩම සහ දේපොළ අයිති තැනැත්තා තමාගේ උරුමක්කාරයන්, පොල්මංකාරයන්, අද්මිනිස්ත්‍රාසිකරුවන් සහ පැවරුම්ලාභීන් හෝ එකී අයිතිකරු නොහොත් ඉහත කී අය විසින් නියම කෙරෙන වෙනත් අයකු හෝ එකී දේපොළ පිළිබඳ සියලුම අවශ්‍ය හෝ නියමිත හිමිකරවලට සහ ආරක්ෂණවලට මා වෙනුවෙන් අත්සන් කටයුතු වන්නේය.

එකී දේපොල ද, ඒවායේ කුලී සහ ලාභ ප්‍රයෝජන ද ඒවායෙහි හෝ ඒවා පිළිබඳ මගේ සියලුම බුදල් හිමිකම් ද අයිතිය සහ සම්බන්ධකම් ද, එකී අයිතිකරුට ඔහුගේ උරුමක්කාරයන්ට, පොල්මංකාරයන්ට, අද්මිනිස්ත්‍රාසිකරුවන්ට සහ පැවරුම්ලාභීන්ට සම්පූර්ණ ලෙසත්, සාර්ථක ලෙසත් පැවරීම සහ මාරුකිරීම සඳහා අවශ්‍යයයි ද, නිසියයි ද, අවස්ථානුරූප යයිද, පෙනී යන වෙනත් මොනයම් ක්‍රියාවක් වුව ද, මෙම ඇටෝර්නි බලය පවරා නොදී තිබිය දී මමම පැමිණ සිටියෙම් නම් මා හටම කරන්නට සිදුවෙන පරිදි යථාර්ථයෙන් ඉටු කිරීම සඳහා මෙයින් බලය පැවරේ.

තව ද, ඉහත සඳහන් කරුණු සම්බන්ධයෙන් මගේ ඇටෝර්නි බලකරු විසින් සපයනු ලබන්නා වූ ද, පිළියෙළ කරනු ලබන්නා වූ ද, අත්සන් තබනු ලබන්නා වූ ද, කරනු ලබන්නා වූ ද, සියලුම කුවිතාන්සි, නිදහස් කිරීම්, හිමිකර නීත්‍යානුකූල ලේඛණ සහ ආරක්‍ෂණ ද, කටයුතු ක්‍රියාවන් කරුණු සහ දේවල් ද මවිසින් නිසි පරිදි පෞද්ගලිකව ඒවා හෝ ඒවාට අත්සන් තබනු ලැබුවාක් ලෙස ද පවරනු, බාර දෙනු හෝ පිළියෙළ කරනු ලැබුවාක් ලෙස ද යථාර්තයෙන් වලංගු ලෙස හා ක්‍රියාත්මක ලෙස පිළිගත යුතු බව මම මෙයින් නියම කොට ප්‍රකාශ කර සිටිමි.

මිලකර ගත හැකි ප්‍රතිජ්ඨාවක් උඩ දෙනු ලබන මෙම ඇටෝර්නි බලය, එකී ණය මුදල ආපසු ගෙවා අවසන් වන තෙක් අවලංගු කළ නොහැකි වන්නේය.

මෙම ඇටෝර්නි බලය ප්‍රකාර, මෙහි සඳහන් කාරණාව සම්බන්ධයෙන් මගේ එකී ඇටෝර්නි බලකරු විසින් නීත්‍යානුකූලව කරනු ලබන හෝ කරවනු ලබන කවර දෙයක් වුව ද, කලින්කලට මෙන්ම සියලු කල්හිම බාර ගැනීමටත්, ස්ථිර කිරීමටත් මම මෙයින් පොරොන්දු වෙමි.

මීට සාක්ෂි වශයෙන් 19..................ක් වූ ...........................මස .....................වැනි දින ................දී මවිසින් මෙහි අත්සන් තබන ලදී.

...................................
අත්සන.

<u>සාක්‍ෂිකරුවෝ:-</u>

(1) .................................................
(2) .................................................